| ලංකා බැංකුව | 2,019,520.11 | 3,821,492.28 |
| | 2,495,323.79 | 4,041,362.07 |

## ඇමුණුම් 11.

- **තැන්පතු ගෙවීම්**

| | | |
|---|---|---|
| IWSS සමීක්ෂණය | 4,580.57 | 4,580.57 |
| NVQ සහතිකලාභින්ගේ තැන්පතු ගාල්ල | 19,000.00 | 19,000.00 |
| NVQ සහතිකලාභින්ගේ තැන්පතු බෙලිඅත්ත | 6,000.00 | 6,000.00 |
| | 29,580.57 | 29,580.57 |

## ඇමුණුම් 11 a

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය 2010.01.01 | 48,097.63 | 148,797.13 |
| අඩුකිරීම් වියදම් | - | - |
| පාරිසරික කළමණාකරණ සමාගම | - | 100,700.00 |
| | 48,097.63 | 249,497.13 |

## ඇමුණුම් 12.

- **උපචිත වියදම්**

| | | |
|---|---|---|
| විගණන ගාස්තු-NBT- 2005 | - | 180.00 |
| විගණන ගාස්තු-2010 | 85,000.00 | 80,000.00 |
| විගණන ගාස්තු-2011 | 80,000.00 | - |
| විදුලිය | 64,223.36 | 51,102.79 |
| ජල බිල්පත් | 2,890.85 | 3,860.31 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | - | 8,724.80 |
| පොදු නඩත්තු | 1,793.52 | 1,543.00 |
| දුරකථන බිල්පත් | 42,141.43 | 10,887.21 |
| ගෙවිය යුතු වැටුප් | 9,000.00 | 30,000.00 |
| ගෙවිය යුතු අතිකාල | 14,857.00 | 20,383.78 |
| ගෙවිය යුතුගමන් වියදම් | 3,850.00 | 2,625.00 |
| ගෙවිය යුතු ඉන්ධන | | 20,700.00 |
| ගෙවිය යුතු විද්‍යුත් තැපැල | 3,188.85 | 3,927.60 |
| ගෙවිය යුතු සම්මන්ත්‍රණ හා වැඩමුළු වියදම්-Triad Media | | 29,998.85 |
| Sumithra Enterprises-News Paper Bill | 1,470.00 | - |
| නිවාඩු දින දීමනා | 527.00 | - |
| Youth Service Ltd | 39,118.42 | - |
| The ANCL Sri Lanka Insurance | 24,192.00 | - |
| | 1,075.87 | - |
| National Vocational Training Institute | 59,045.00 | - |
| Dropout Study - මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න | 360,000.00 | 360000 |
| | 792,373.30 | 623,933.34 |

## ඇමුණුම් 13.

➢ **පාරිතෝෂික වෙන් කිරීම්**

| | | |
|---|---|---|
| ඒ.වී.ඩී.ඩී.පෙරේරා | 9,886.50 | 91,900.00 |
| කේ.එස්.එන්.පෙරේරා | 121,167.75 | 102,450.00 |
| කේ.පී.පී.බී.විජේසිංහ | 98,865.00 | 82,710.00 |
| පී.එම් පින්නදූව | 101,227.50 | 84,735.00 |
| කේ.බී.පී.වාමිනී | 105,952.50 | 88,717.50 |
| සී.ආර්.මද්දගේ | 105,952.50 | 88,717.50 |
| සී.කේ. ජයසේකර | 109,260.00 | 91,440.00 |
| කේ.පී.සී.එම් දිල්රුක්ෂි | - | - |
| ඩබ්.එච්.ඊ. ජයරත්න | 101,227.50 | 84,735.00 |
| ජේ.ඒ.සී.පී ජයසිංහ | 28,167.75 | 13,070.00 |
| එම්.ජේරුසිංහ | 22,566.00 | 10,500.00 |
| එස් .එන් ජයනෙත්ති | 22,681.50 | 10,532.50 |
| එම්.කේ.ඒ.එන් සඳමාලි | 22,681.50 | 10,532.50 |
| කේ.ඒ.එම් දමයන්ති | 20,277.00 | 9,422.50 |
| එස්.ඒ.පී. ප්‍රියංග | 11,227.88 | - |
| එම්.පී.කේ. ලක්මාල් | 9,645.00 | - |
| | 890,785.88 | 769,462.50 |

## ඇමුණුම් 14.

**ණය ගැති වයස් විශ්ලේෂණය**

| ණය ගැතියා | ණය කාලය(අවුරුදු) | මුදල රු. | මුදල රු. |
|---|---|---|---|
| NIBM | 6 | - | 76,000.00 |
| ප්‍රාදේශීය ලේකම් | 4 | 48,212.00 | 48,212.00 |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 2 | - | 21,702.28 |
| | | 48,212.00 | 145,914.28 |

**මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම්**

# මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම්-2011

| වැය විෂය | ඇස්තමේන්තුව 2011 | සත්‍ය වියදම 2011 | ඇස්තමේන්තු |
|---|---|---|---|
| | රු ශත | රු ශත | වියදමේ ප්‍රතිශතයක් |
| **පුනරාවර්තන වියදම්** | | | |
| **පුද්ගල පඩිනඩි** | | | |
| වැටුප් සහ වේතන | 4,576,000.00 | 4,410,903.00 | 96.39 |
| සේවක අර්ථසාධක | 568,000.00 | 453,720.00 | 79.88 |
| සේවක භාරකාර | 180,000.00 | 113,431.00 | 63.02 |
| වැඩබලන වැටුප් | 0.00 | 0.00 | 0.00 |
| අතිකාල වැටුප් | 274,000.00 | 166,029.00 | 60.59 |
| නිවාඩු වැටුප් | 196,000.00 | 40,560.00 | 20.69 |
| පාරිතෝෂිත දීමනා | 180,000.00 | 108,752.00 | 60.42 |
| | **5,974,000.00** | **5,293,395.00** | 88.61 |
| | | | |
| **ගමන් වියදම්** | | | |
| දේශීය | 326,000.00 | 299,679.00 | 91.93 |
| විදේශීය | 250,000.00 | 62,241.00 | 24.90 |
| | **576,000.00** | **361,920.00** | 62.83 |
| **සැපයුම්** | | | |
| ලිපිද්‍රව්‍ය | 150,000.00 | 22,176.00 | 14.78 |
| ඉන්ධන | 506,000.00 | 437,806.00 | 86.52 |
| අනෙකුත් | 10,000.00 | 0.00 | 0.00 |
| | **666,000.00** | **459,982.00** | 69.07 |
| **නඩත්තු වියදම්** | | | |
| වාහන | 406,000.00 | 398,486.00 | 98.15 |
| දේපළ/පිරියත/උපකරණ | 312,000.00 | 299,256.00 | 95.92 |
| ගොඩනැගිලි සහ ව්‍යුහය | 9,000.00 | 7,210.00 | 80.11 |
| ලි බඩු | 0.00 | 0.00 | 0.00 |
| අනෙකුත් | 0.00 | 0.00 | 0.00 |
| | **727,000.00** | **704,952.00** | 96.97 |
| **ගිවිසුම්ගත සේවාවන්** | | | |
| කුලි වාහන | 480,000.00 | 480,000.00 | 100.00 |
| දුරකථන | 279,000.00 | 278,176.00 | 99.70 |
| තැපැල් ගාස්තු | 10,000.00 | 5,390.00 | 53.90 |
| විදුලිය | 816,000.00 | 673,361.00 | 82.52 |
| ජලය | 46,000.00 | 35,571.00 | 77.33 |
| පිරිසිදු කිරීම් ගාස්තු | 104,000.00 | 90,791.00 | 87.30 |
| ආරක්ෂණ ගාස්තු | 360,000.00 | 330,000.00 | 91.67 |
| කුලිය | 44,000.00 | 43,556.00 | 98.99 |
| අනෙකුත් | 788,000.00 | 778,997.00 | 98.86 |
| | **2,927,000.00** | **2,715,842.00** | 92.79 |
| **අනෙකුත්** | | | |
| සේවක ශුභ සාධන | 48,000.00 | 22,953.00 | 47.82 |
| දායක ගාස්තු | 19,000.00 | 14,670.00 | 77.21 |
| සංග්‍රහ වියදම් | 99,000.00 | 95,546.00 | 96.51 |
| පෙර වර්ෂය සඳහා ගෙවීම් | 194,000.00 | 193,564.00 | 99.78 |
| සේවක ණය අරමුදල | 270,000.00 | 270,000.00 | 100.00 |
| | **630,000.00** | **596,733.00** | 94.72 |
| **මුලු පුනරාවර්තන වියදම්** | **11,500,000.00** | **10,132,824.00** | 88.11 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | **ප්‍රාග්ධන වියදම්** | | | |
| | **<u>ස්ථාවර වත්කම්</u>** | | | |
| | **<u>අත්පත්කර ගැනීම</u>** | | | |
| | දේපළ/පිරියත සහ උපකරණ | 1,250,000.00 | 1,151,275.20 | 92.10 |
| | ලි බඩු | 800,000.00 | 296,454.19 | 37.06 |
| | අනෙකුත් | 250,000.00 | 18,140.00 | 7.26 |
| | | **2,300,000.00** | **1,465,869.39** | 63.73 |
| | | | | |
| | **අනෙකුත් ප්‍රාග්ධන වියදම්** | | | |
| | **<u>NHRDC ක්‍රියාකාරකම්</u>** | | | |
| | අධ්‍යයන/සංගණන/සමීක්ෂණ | | | |
| | පර්යේෂණ | 43,100.00 | 43,100.00 | 100.00 |
| | සම්මන්ත්‍රණ සහ වැඩමුලු | 15,333,000.00 | 14,836,492.75 | 96.76 |
| | HRD ව්‍යාපෘති | 4,153,100.00 | 4,585,055.31 | 110.40 |
| | ප්‍රකාශන | 0.00 | 0.00 | 0.00 |
| | | **19,529,200.00** | **19,464,648.06** | 99.67 |
| | **මුලු ප්‍රාග්ධන වියදම්** | **21,829,200.00** | **20,930,517.45** | 95.88 |

# මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම්-2011

| පුනරාවර්තන වියදම් | |
|---|---|
| පුද්ගල පඩිනඩි සහ වේතන | 5,370,902.34 |
| ගිවිසුම්ගත සේවාවන් | 2,474,060.05 |
| ගමන් වියදම් | 365,769.74 |
| සැපයුම් | 544,637.65 |
| නඩත්තු වියදම් | 2,082,475.57 |
| අනෙකුත් | 227,876.14 |
| **එකතුව** | **11,065,721.49** |

| ප්‍රාග්ධන වියදම් | |
|---|---|
| දේපල පිරියත සහ උපකරණ | 8,501,369.39 |
| අධ්‍යයන/සංගණන/සමීක්ෂණ<br>පර්යේෂණ | 43,100.00 |
| එච්.ආර්.ඩී ව්‍යාපෘති | 3,870,537.31 |
| සම්මන්ත්‍රණ සහ වැඩමුලු | 15,268,510.75 |
| **එකතුව** | **27,683,517.45** |






### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරා ගත් පර්පාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාචෝචිතව උචිත විගණන පර්පාටි සැලැසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සභාව වෙත සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු. 8,567,852 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාර ගිණුම් ගත කර නො තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ලෙජරය සමඟ නොසැසඳීම් රු. 68,915 ක් අප විසින් කළ නිරීක්ෂණයන්ට අනුව අවශ්‍ය නිවැරදි කිරීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු නමුත් තවදුරටත් එවැනි ගිණුම්කරණ දෝෂ පැවැතිය හැකිය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

---

2011 වර්ෂය තුළ සභාවේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇති වටිනාකම හා වාර්ෂික ප්‍රගති වාර්තාවේ එම වර්ෂය තුළ ඉටු කළ ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති වටිනාකම් අතර රු. 282,452 ක නොසැසඳුණු වෙනසක් විය.

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| (i) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට තෙ මසකට පෙර කෙටුම්පත් අයවැය ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුව ද, 2011 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2012 මාර්තු 29 දින දී ය. |
| (ii) 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීමේ පනත | ප්‍රතිපාදිත පාර්තෝෂික දීමනා අනාගත වගකීම්වලට මුහුණ දීමට හැකි වන පිණිස ආයෝජනය කර නො තිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි

----------------

| | |
|---|---|
| මු.රෙ. 371.2(ආ) උප ඡේදය | තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් රු. 20,000 කට වැඩි මුදලක් ලබා නොගත යුතු වුව ද, අවස්ථා 23 ක දී රු. 20,000 ඉක්මවා කළ ගෙවීම්වල එකතු වටිනාකම රු. 1,340,000 ක් විය. |

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

-----------------------------------

| | |
|---|---|
| 1.2.1 උප ඡේදය | අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර අවස්ථා 18 ක දී රු. 3,483,317 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. |

(ඈ) චක්‍රලේඛ

---------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

------------------------------------------

| | | |
|---|---|---|
| (i) | 5.2.6 උප ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශනයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සහ සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවැයගත ශේෂ පත්‍රයක් පිළියෙල කර අයවැය ලේඛණය සමඟ ඉදිරිපත් කර නො තිබුණි. |
| (ii) | 6.5.1 උප ඡේදය | මුදල් වර්ෂය අවසාන වී දින 60 කට පෙර කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම්, රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2005 වර්ෂයේ සිට මේ දක්වා ඒ අනුව කටයුතු කර නො තිබුණි. |
| (iii) | 7.4.2 උප ඡේදය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නො තිබුණි. |

03. **මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.758,795 ක ඌනතාවක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,563,052 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 2,321,847 ක පිරිහීමට රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. 334,893 කින් අඩු වී තිබීම හා පුනරාවර්තන වියදම් රු. 2,021,393 කින් වැඩි වී තිබීම යන කරුණු විශේෂයෙන් බල පා තිබුණි.

04. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සභාව සංස්ථාපනය කළ පනතේ 14(I) ඡේදය ප්‍රකාර ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියළු අංශවලින් අමාත්‍යවරයාට උපදෙස් දීම, ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධන සැලැසුම් හා වැඩසටහන් ආණ්ඩුවට ඉදිරිපත් කිරීම සහ ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය හා ක්‍රියාත්මකව පවත්නා සැලැසුම් හා වැඩසටහන්වලට කළ යුතු වෙනස් කිරීම් පිළිබඳව අමාත්‍යවරයාට නිර්දේශ කිරීම මෙන්ම, ආණ්ඩුව විසින් අනුමත කළ මානව සම්පත් සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම යන සභාවේ ප්‍රධාන කාර්ය හා කර්තව්‍ය කිසිවක් සමාලෝචිත වර්ෂය තුල ඉටු කර නොතිබුණි.

(ආ) සභාවේ මූලික අරමුණ වූ මානව සම්පත් සංවර්ධනය සඳහා වැය කළ මුදල මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස පහත පරිදි ය.

| වර්ෂය | මුළු පුනරාවර්තන වියදම | මානව සම්පත් සංවර්ධන වැය | මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධන වැය |
|---|---|---|---|
| | රු. | රු. | (%) |
| 2005 | 5,152,941 | 844,454 | 16.4 |
| 2006 | 5,868,600 | 692,147 | 11.8 |
| 2007 | 6,086,767 | 535,632 | 8.8 |
| 2008 | 6,728,939 | 659,801 | 9.8 |
| 2009 | 8,675,394 | 1,540,029 | 17.7 |
| 2010 | 12,423,287 | 3,378,959 | 27.2 |
| 2011 | 30,247,869 | 19,182,148 | 63.42 |

2011 වර්ෂය සඳහා වූ මුළු මානව සම්පත් සංවර්ධන වියදමින් විද්‍යුත් හා පුවත්පත් මාධ්‍ය දැන්වීම් සඳහා කළ රු. 9,939,546 ක වියදම් අඩු කළ පසු මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධන වැය ප්‍රතිශතය 63.42% ක් නොව 48% ක අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) ඩබ්ලිව් - 9 වැඩසටහන යටතේ ඉලක්ක ගත කණ්ඩායමේ මානසික තත්ත්වය වර්ධනය කිරීම උදෙසා පෞරුෂ සංවර්ධන ක්‍රියාවලියක් තුලින් ඔවුන් නගා සිටුවීම හා විකල්ප වෘත්තීය මාර්ගවලට යොමු වීම තුලින් ජීවිතය ජය ගත හැකි බව පෙන්වා දීම හා ඒ සඳහා ඔවුන්ව අදාල පුහුණු ආයතනවලට යොමු කිරීම මූලික අරමුණ කර ගෙන අ.පො.ස. (සා.පෙළ) සියළු විෂයයන් අසමත් සිසුන් සවිබල ගැන්වීමේ විශේෂ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ඉහත ව්‍යාපෘතිය සඳහා 2011 දෙසැම්බර් 31 දින වන විට රු.12,979,803 ක් වියදම් කර තිබුණු අතර ඉන් රු. 6,427,856 ක් එනම් සමස්ත වියදමින් 50% ක් ප්‍රචාරණ කටයුතු සඳහා පමණක් වැය කර තිබුණි.

(ii) විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති දත්තවලට අනුව විෂයයන් 09 ම අසමත් මුළු සිසුන් ගණන 8873 ක් වුවත්, ව්‍යාපෘතිය සඳහා අයදුම් කර තිබුණු මුළු සිසුන් ගණන 1201 ක් විය. එනම් ඉලක්කගත කණ්ඩායමෙන් 13% ක් වැනි අඩු සංඛ්‍යාවකි.

(iii) ව්‍යාපෘති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුල සෑම දිස්ත්‍රික්කයකටම එක් දින සම්මන්ත්‍රණයක් හා දින 05 ක කඳවුරක් බැගින් පැවැත්වීමට අරමුණු කර ගෙන තිබුණ ද, දිස්ත්‍රික් මට්ටමින් සම්මන්ත්‍රණ 14 ක් හා නේවාසික වැඩමුළු 04 ක් පමණක් පවත්වා තිබුණි. එම නේවාසික වැඩමුළු 04 සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අයදුම් කළ 1201 දෙනෙකුගෙන් 510 ක් පමණක් විය. නමුත් දිස්ත්‍රික් සම්මන්ත්‍රණ හා නේවාසික වැඩමුළු වෙනුවෙන් දරන ලද වියදම පිළිවෙලින් රු. 439,703 ක් හා රු. 6,223,420 ක් විය.

(iv) මෙම වැඩසටහන සඳහා විවිධ විද්වතුන්ගේ සහාය ලබා ගැනීමේ අරමුණින් සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබුණු නමුත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ යෝජනා කිසිවක් ඔවුන් වෙතින් ලැබී නොතිබුණි.

(v) එම නේවාසික කඳවුරු අවසානයේ එයට සහභාගී වූ සිසුන් පුහුණු ආයතන වෙත යොමු කිරීමට අපේක්ෂා කළ ද, ඒ සඳහා පුහුණු ආයතනයක් ලෙස ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය(NAITA) පමණක් ඉදිරිපත්ව තිබුණි. කෙසේ නමුත්, සිසුන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා ඔවුන් අපේක්ෂා කරන වෘත්තීය පුහුණුවලට ගැලපෙන ආකාරයේ පුහුණු අවස්ථා එම ආයතනය සතු නොවීම මත මෙම කාර්යය ඉටු කර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(vi) ඉලක්කගත නියැදිය හා ඔවුන්ගේ අපේක්ෂාවන් පිළිබඳ පූර්ව අධ්‍යනයකින් තොරව හුදෙක් ආකර්ෂණීය ප්‍රචාරක දැන්වීම් කෙරෙහි පමණක් විශ්වාසය තබමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් මෙතෙක් මෙම ව්‍යාපෘතියට සිය අරමුණු කරා ළඟාවීමට නොහැකිව අසාර්ථක වී තිබුණි.

(ඇ) " විරැකියාවෙන් සුරැකියාවට " ව්‍යාපෘතිය

------------------------------------------

අනුරාධපුර දිස්ත්‍රික්කය තුල රැකියා අපේක්ෂිත පිරිස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලියාපදිංචි කර එම තොරතුරු සභාවේ වෙබ් අඩවියේ පල කිරීම, රැකියා සැපයිය හැකි පෞද්ගලික ආයතන ලියාපදිංචි කර ගැනීම හා ඔවුන් සියළු දෙනා 2012 මාර්තු 31 දිනට පෙර පෞද්ගලික අංශයේ රැකියාවලට යොමු කිරීම අරමුණු කර ගෙන "විරැකියාවෙන් සුරැකියාවට" යනුවෙන් සුවිශේෂ ව්‍යාපෘතියක් 2012 දැයට කිරුල ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව ආරම්භ කර තිබුණි.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා ආකල්ප සංවර්ධන හා මානව සම්පත් කළමනාකරණ උපදේශකවරයෙකු සමඟ 2011 ජූලි 05 දින ගිවිසුමකට එළැඹ තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත වටිනාකම රු. 1,248,000 ක් වූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 වැනි පරිච්ඡේදය පරිදි මෙම කාර්ය තරඟකාරී ලංසු කැඳවීමකට යොමු කර නොතිබුණි. එමෙන්ම, එම පරිච්ඡේදයේ 3.12 උප ඡේදය පරිදි අදාල සැපයුම්කරුගේ පූර්ව සුදුසුකම් පිළිබඳ පරීක්ෂාවක් ද සිදු වී නොතිබුණු අතර 8.12.4 උප ඡේදය පරිදි ගිවිසුමේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව සේවා ඉටු කර ඇති බවට සහතිකයක් ස්ථානභාර නිලධාරියා විසින් නිකුත් කර නොතිබුණි.

(ii) 2012 මාර්තු 31 දින ගිවිසුම් ප්‍රකාර ව්‍යාපෘතිය අවසන් විය යුතු නමුත් , 2012 අප්‍රේල් 27 විගණිත දින වන විටත් දත්ත බැංකුවට ඇතුලත් කර තිබුණු ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව 790 ක් විය. නමුත් ඉන් කොපමණ සංඛ්‍යාවක් රැකියාගත කළේ ද යන්න හා ලියාපදිංචි කළ පෞද්ගලික ආයතන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනය වෙත ලබා දීමට සභාව අපොහොසත් වූ අතර විෂයභාර නිලධාරියා සතුව ද එම තොරතුරු කිසිවක් නොතිබුණි.

(iii) දත්ත බැංකුවට අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කය තුල රැකියා අපේක්ෂිත පිරිස 790 දෙනෙකු යන්න විවාදාත්මක බැවින් මෙම සේවා කොන්ත්‍රාත්තුව භාර ගත් සැපයුම්කරු ස්වකීය සේවය නිසි පරිදි ලබා දුන්නේ ද යන්න විගණනයේ දී ගැටළු සහගත විය. එමෙන්ම, ලියාපදිංචි කර ගන්නා රැකියා වියුක්තිකයින් සේවයේ නියුක්ත කිරීමට අවශ්‍ය පෞද්ගලික ආයතන ලියාපදිංචි කර නොතිබීම හා රැකියා ගත කළ පිරිසක් ද නොවීමෙන් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු. 2,218,153 ක මුදල නිශ්ඵල වියදමක් වී තිබුණි.

(ඉ) මානව සම්පත් වසර

---------------------

2011 සැප්තැම්බර් 22 දින සිට 2012 සැප්තැම්බර් 22 දින දක්වා මානව සම්පත් සංවර්ධන වසර ලෙස සභාව විසින් හදුනා ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් "නිපුණතා සඳ" යනුවෙන් වූ ආධුනික රූපවාහිනී ගායනා වැඩසටහනක් ඉදිරිපත් කිරීමට සැලැසුම් කර තිබුණි. මේ සඳහා පුවත්පත් දැන්වීම් වෙනුවෙන් 2011 වර්ෂය තුල රු. 3,082,453 ක් වැය කර තිබුණි. පුවත් පත් දැන්වීම් පල කිරීම හැරුණු කොට 2012 අප්‍රේල් 27 දින දක්වාමත් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියක් නොවීය.

(ඊ) මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන

-----------------------------------------

2011 වාර්ෂික ක්‍රියාකාර සැලැසුමට අනුව වර්ෂය තුල වැඩසටහන් 12 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණ ද පවත්වා තිබුණේ එක් වැඩසටහනක් පමණි. එයට සහභාගී වූ සංඛ්‍යාව 129 දෙනෙකු පමණක් වූ අතර වැඩමුළුවට අදාලව පුවත්පත් දැන්වීම් සඳහා රු. 78,624 ක් ද, වැඩමුළුව සඳහා රු. 12,900 ක් ද වශයෙන් එකතුව රු. 91,524 ක වියදමක් දරා තිබුණි.

(උ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

---------------------------------------

සභාව විසින් 2010 වර්ෂය තුල ආරම්භ කළ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති නිම නොකර 2011 වර්ෂය වන විට අත්හැර දමා තිබුණි.

(i) විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකු සමඟ ගිවිසගත් පරිදි පාඨමාලා හැරයන සිසුන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර අදාල වාර්තාව 2010 අප්‍රේල් 10 දින හෝ ඊට පෙර සභාවට භාර දිය යුතු නමුත් එය ඉටු වී නොතිබුණි. වැය කළ මුදල රු. 76,875 කි.

(ii) ගරු අමාත්‍යතුමාගේ නියෝග මත ආරම්භ කළ F - 3 වැඩසටහන, අපොස උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විභාග අසමත් වී අතරමංවන සිසුන් විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් මඟින් ක්ෂණික පුහුණුවක් ලබා දී රැකියාගත කිරීම මූලික අරමුණ වූ නමුත් කිසිම ශිෂ්‍යයෙකුට රැකියාවක් ලබා දී නොතිබුණු අතර දින කිහිපයක පුහුණුවකට සහභාගී වූ සිසුන් 9737 දෙනාගේ වර්තමාන ප්‍රගතිය කෙබඳු ද යන්න පිළිබඳව පසු විපරමක් හෝ සිදු කර නොතිබුණි. 2010 දෙසැම්බර් සිට 2011 අප්‍රේල් දක්වා රු. 5,601,870 ක වියදමක් මේ සඳහා වැය කර තිබුණු අතර ඉන් 90% ක් හෙවත් රු. 5,066,419 ක් විද්‍යුත් හා පුවත්පත් මාධ්‍ය දැන්වීම් වෙනුවෙන් වැය කර තිබුණි.

## 05. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උප ඡේදය පරිදි පූර්ව තෙ වර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2010-2014 කාල සීමාවට අදාලව සකස් කළ සංයුක්ත සැලසුමෙහි අන්තර්ගතව නො තිබුණි. එමෙන්ම, මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන් හි මූල්‍යමය අගයන් දක්වා නො තිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගැයීමට නොහැකි විය. තව ද, 2011-2015 කාල පරිච්ඡේදයට අදාලව සමාලෝචනය කරන ලද සංයුක්ත සැලැසුම 2012 මැයි 08 විගණිත දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාර සැලැස්ම

2011 වර්ෂය සඳහා වූ ක්‍රියාකාර සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධන සහිතව අනුමත කර තිබුණේ 2012 මාර්තු 29 දින දී ය. එනම් සමාලෝචිත වර්ෂය ද අවසන් වී මාස 03 ක් ගත වූ පසුව ය. ආයතනයේ පවතින අරමුණුවලට එකඟ වන පරිදි ඉදිරි වර්ෂයේ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ස්ථාපිත කිරීම හා මනා කළමනාකරණයකින් යුතුව ඒ සඳහා වියදම් දැරීමත් වාර්ෂික ක්‍රියාකාර සැලැසුමක අරමුණ වන බැවින්, වර්ෂය ඉකුත් වී ගිය පසු පිළියෙල කරන සැලැසුමක ඵලදායිතාව විගණනයේ දී ගැටළුසහගත විය.

2011 වර්ෂය සඳහා අනුමත මුල් ක්‍රියාකාර සැලැසුමට අනුව එහි ප්‍රගතිය පහත පරිදි විය.

(අ) 2011 වාර්ෂික ක්‍රියාකාර සැලැසුමේ දැක්වෙන පරිදි රු. 8,570,000 ක් වූ වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2011 වාර්ෂික ක්‍රියාකාර සැලැසුමට ඇතුළත්ව නොතිබුණු මානව සම්පත් වසර නැමැති වැඩසටහන වෙනුවෙන් වර්ෂය තුල රු. 3,086,400 ක් වැය කර තිබුණි.

(ඇ) එක් ප්‍රධාන වැඩසටහනක් යටතේ පැවැත්වීමට අපේක්ෂිත අනු වැඩසටහන් 50 ක් සඳහා එක් වැඩසටහනකට රු. 12,500 බැගින් රු. 625,000 ක ප්‍රතිපාදන ක්‍රියාකාර සැලැසුම මගින් වෙන් කර තිබුණු නමුත් එවැනි අනු වැඩසටහන් 38 ක් පැවැත්වීමට පමණක් රු. 14,853,000 ක් වැය කර තිබුණි. ඒ අනුව එක් වැඩසටහනක් පැවැත්වීමට දරන ලද වියදම රු. 390,868 ක් වූ අතර එය සැලැසුම් කළ වියදමින් 3127% ක ප්‍රමාණාත්මක ප්‍රතිශතයක් විය.

5.3 අභ්‍යන්තර විගණනය

----------------------

වර්ෂයකට රු.මිලියන 30කට වැඩි පුනරාවර්තන වියදම් දරන මෙම සභාව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් සභාව තුල ස්ථාපිත කර නො තිබුණු අතර යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සභාවේ කටයුතු විගණනයට භාජනය කර තිබුණි.

5.4 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර වූ විචලනයන් සලකා බැලීමේ දී වියදම් අයිතම 08 ක් රු. 3,489,511 ක සැලකිය යුතු විචලනයන් පැවැති හෙයින් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නො තිබුණු බව නිරීක්ෂණය විය.

06. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ සභාපති වරයාගේ අවධානයට යොමු කරන ලදී . පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) සැපයුම් හා සේවා
(ඇ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

මගේ අංකය : NHRDC/02/Audit Q/2011

2012.07.05

ඔබේ අංකය : පී වයි/බී/එන් එච් ආර් ඩී සී/2011/එෆ් ඒ

අවධානය : ඩබ්.ප්‍රේමනන්ද මහතා

සහකාර විගණකාධිපති.

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නිදහස් චතුරස්‍රය,

කොළඹ 07.

**<u>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත කරුණ මැයෙන් ඔබේ අංක පී වයි/බී/එන් එච් ආර් ඩී සී/2011/එෆ් ඒ හා 2012 මැයි 24 දිනැති අප ආයතනයට ලද ලිපිය සම්බන්ධවයි.

ඔබගේ විමසීම් වලට අනුව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පිළිතුරු ඔබගේ කාරුණික අවධානය සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

නිලන්ති සුගතදාස

සභාපති(වැ. බ.)

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව.

පිටපත :

01. ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.පි.
03. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන), යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය- දැ.ගැ.පි.

## කෙටුම්පත.

**<u>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

02 කොටස

මූල්‍ය ප්‍රකාශන.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත.</u>

එකඟ නොවෙමි.

2011 වර්ෂයේ දී රජයේ ප්‍රාග්ධන ප්‍රධාන ලෙස සභාව වෙත ලද මුදල වූයේ රු.මිලියන 21 කි. එම මුදල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව ගිණුම් ගත කර ඇත.

2.2.2. <u>ගිණුම්කරණ අඩුපාඩු.</u>

(අ) එකඟ නොවෙමි.

| විස්තරය | වෙනස (රු.) | අදාල වියදම් ශීර්ෂය | හේතුව |
|---|---|---|---|
| වාහන අළුත්වැඩියා හා නඩත්තු | 1,800/- | 393 | ලෙජරයේ අංක 393 යටතේ මාසිකව රු.150/- බැගින් මාස 12 සඳහා බැර කර ඇති වටිනාකම. |
| විදුලිය | 64,224/- | 372 | ජර්නල් අංක : 15/11 |
| ජලය | 2,891/- | 373 | ජර්නල් අංක : 15/11 |
| | 68,915/- | | |

(ආ) එකඟ නොවෙමි.

2011 වර්ෂය තුල සභාවේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇති වටිනාකම හා වාර්ෂික ප්‍රගති වාර්තාවේ එම වර්ෂය තුල ඉටු කළ ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති වටිනාකම් අතර වෙනස වනුයේ රු.282,500 කි. එයට හේතුව වූයේ දැයට කිරුළ වැඩසටහන සඳහා මිලදී ගත් රු.280,000 ක් වටිනා ලැප්ටොප් පරිගණක 02 සහ රු.2,500/- ක් වටිනා Pen drive එකෙහි වටිනාකම් එකතුවයි. එම වටිනාකම් එකතුව අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී ජර්නල් අංක 03/11 මගින් ස්ථාවර වත්කම් මිලදී ගැනුම් වලට එකතු කරන ලදී.

2.2.3. <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තිරණ වලට අනුකූල නොවීම.</u>

(අ) පනත්.

(I) 1971 අංක 38 දරණ මුදල් පනතේ 8 (1) වගන්තිය.

එකඟ වෙමි.

මෙම වරද 2012 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(II) 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත ප්‍රකාර ප්‍රතිපාදිත පාරිතෝෂිත දීමනා අනාගත වගකීම් වලට මුහුණ දීමට හැකි වනු පිණිස ආයෝජනය කිරීම සිදු නොකරන ලද්දේ මුදල් වෙන් කිරීමෙන් තොරව ගිණුම්මය ප්‍රතිපාදනයක් පමණක් සිදු කළ නිසාය.

(ආ) <u>මුදල් රෙගුලාසි</u>

මු.රෙ. 371.2 (ආ) උපජේදය.

එකඟ වෙමි.

අප ආයතනයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල කාර්යය මණ්ඩලය තිදෙනෙකුට සීමා වී තිබූ බැවින් අත්තිකාරම් මුදල් ලබා දීමේ දී රු.20,000/- ක උපරිමය ප්‍රායෝගික නොවිය. තව ද අප සභාව විසින් අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ආයතනයෙන් බැහැරව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමේ දී රු.20,000/- ට වැඩි ප්‍රමාණයන්ගෙන් අත්තිකාරම් මුදල් ලබා දීමට සිදු විය.

(ඇ) <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය.</u>

1.2.1. උපජේදය.

එකඟ වෙමි.

මෙම වරද 2012 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(ඈ) <u>චක්‍රලේඛ</u>

<u>2003 ජුනි 02 දිනැති අංක පී ඊ ඩී / 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.</u>

(I) 5.2.6. උප ජේදය.

එකඟ වෙමි.

මෙම වරද 2012 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(II) 6.5.1. උපජේදය.

එකඟ නොවෙමි.

2006, 2007, 2008, 2009 වාර්ෂික වාර්තා මේ වන විට පාර්ලිමේන්තුවට යොමු කර ඇති අතර 2010 කෙටුම්පත් වාර්තාව පිළියෙල කර ඉංග්‍රීසි, දෙමළ බසින් පරිවර්තනය සඳහා යොමු කර ඇත. 2011 මේ වන විට පිළියෙල කරමින් පවතී.

(III) 7.4.2. උපජේදය.

එකඟ වෙමි.

**<u>03 - කොටස</u>**

**මූල්‍ය සමාලෝචනය.**

3.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

එකඟ වෙමි.

3.2. <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

එකඟ වෙමි.

## <u>04 - කොටස</u>

4.1. <u>කාර්ය සාධනය</u>.

(අ) එකඟ නොවෙමි.

සටහනෙහි මුළු පුනරාවර්තන වියදම යන්න මුළු වියදම යනුවෙන්ද මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධන වැය යන්න මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස මානව සම්පත් සංවර්ධන වැය යනුවෙන් නිවැරදි විය යුතුය.

(ආ) එෆ් - 9 වැඩසටහන

මෙම වැඩසටහන එෆ් - 9 යන්න නොව ඩබ්ලිව් - 9 වැඩසටහන යනුවෙන් නිවැරදි විය යුතුය. තව ද W - 9 යනු මෙම වැඩසටහනේ ලිපි ගොනු නාමය පමණක් වන අතර එහි ව්‍යාපෘති මාතෘකාව වනුයේ **<u>අ.පො.ස. (සා.පෙළ) අසමත් සිසුන් සවිබල ගැන්වීමේ මහා ජාතික සත්කාරයයි.</u>**

(I) එකඟ වෙමි.

මෙම වැඩසටහන ලංකාවේ ප්‍රථම වරට ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ මෙම වර්ෂය තුල දී බැවින්, ජනතාව අතරට වඩාත් ආකර්ෂණීය ලෙස මෙම ව්‍යාපෘතිය ගෙන යාමට හා ඒ සඳහා ජනතාවගේ අවධානය දිනා ගැනීමට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණය යොදා ගැනීමට සිදු විය. අපගේ පර්යේෂණ තුලින් සොයා ගත් පරිදි මෙය සමාජයේ පවතින බරපතල සමාජ අර්බුදයක් හෙයින් එයට විසඳුම් සෙවීම සඳහා විවිධ පාර්ෂවයන්ගේ සහයෝගය ලබා ගැනීමටත්, ජනතාවගේ අදහස්, යෝජනා ලබා ගැනීමටත් මාධ්‍ය ප්‍රචාරණය අත්‍යාවශ්‍ය වූ අතර මෙමගින් ව්‍යාපෘතියට ඉතා ඉහළ වටිනාකමක් ලැබුණි.

(II) එකඟ නොවෙමි.

උක්ත (ආ) කොටසේ සඳහන් කළ අපගේ ව්‍යාපෘතියේ අරමුණ වනුයේඅ.පො.ස. (සා.පෙළ) අසමත් සිසුන් සවිබල ගැන්වීමයි. එහි දී සංඛ්‍යා ලේඛන යොදා ගත්තේ පර්යේෂණ අවශ්‍යතාව සඳහා පමණි.

අප ආයතනයට අයදුම්පත්‍ර ලද සියළුම සිසුන් සඳහා ඉහත ව්‍යාපෘතිය සාර්ථකව සිදු කළෙහ.

(III) එකඟ නොවෙමි.

එම ව්‍යාපෘති වාර්තාවේ අංක 04 අධ්‍යයන ක්‍රමවේදය යටතේ උක්ත ව්‍යාපෘතිය දිස්ත්‍රික් 25 තුලම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, අවශ්‍යතාවය මත පදනම්ව මෙම සංඛ්‍යාව වෙනස් කිරීමට අපේක්ෂා කෙරේ, යනුවෙන් සඳහන් කර ඇත. ඒ අනුව පැවති ප්‍රායෝගික තත්වයන් යටතේ දිස්ත්‍රික් සම්මන්ත්‍රණ 14ක් පමණක් පවත්වනු ලැබුණි.

දිස්ත්‍රික් සම්මන්ත්‍රණ සඳහා පැමිණි සියළුම සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශණය ඇතුලු විශාල දැනුමක් ලබා දුන් අතර ඉන් සිසුන් හා දෙමාපියන්ගේ කැමැත්ත ඇති පිරිස පමණක් කඳවුර සඳහා සහභාගී විය. සම්මන්ත්‍රණ පැවැත්වූ සියළු දිස්ත්‍රික්කයන්හි කඳවුරට පැමිණීමට කැමති සිසුන් සඳහා නේවාසික කඳවුර පවත්වන ලදී.

(IV) එකඟ වෙමි.

මෙය බරපතල සමාජ අර්බුදක් වූ බැවින්, මේ සම්බන්ධයෙන් විද්වත් කමිටු සාකාච්ජා වට කීපයක් පැවැත්වූ නමුදු, ඔවුන්ට ද නිශ්චිත වැඩපිළිවෙලක් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම අපොහොසත් වූයේ මෙය සංකීර්ණ සමාජ ගැටළුවක් බැවිනි.

(V) එකඟ නොවෙමි.

අ.පො.ස. (සා.පෙළ) අසමත් සිසුන්ට ඔවුන් අපේක්ෂා කරන වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීමට පුහුණු ආයතන වල අවස්ථාව නොමැති බව අප හඳුනා ගත්හ. ඒ පිළිබඳව අමාත්‍යවරයා හා සියළුම වෘත්තීය පුහුණු ආයතන ප්‍රධානීන් සමඟ දිගින් දිගටම පවත්වන ලද සාකච්ජා වල ප්‍රතිඵලයක් ලෙස NAITA ආයතනය මගින්, කිසිඳු මූලික සුදුසුකමක් නොමැතිව NVQ level 01 අවස්ථාව සළසා දීමට අපට හැකි විය. එය මෙම ව්‍යාපෘතිය තුලින් ලද විශාල ජයග්‍රහනයකි.

(VI) එකඟ නොවෙමි.

උක්ත (ආ) (I) හි මෙම ව්‍යාපෘතියට  අදාලව ආකර්ෂණීය ප්‍රචාරයක අවශ්‍යතාවය පෙන්වා දී ඇත. උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඉලක්ක ගත සිසුන් අහඹු ලෙස තෝරා ගෙන ඔවුන්ගේ පවතින ගැටළු පිළිබඳ මූලික විමසීමක් සිදු කළ අතර, එම කරුණු විද්වත් කමිටු සමඟ සාකච්ජා කොට ඊට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කිරීමට අප උත්සාහ කළෙමු. එහිදී ඔවුන්ගේ අපේක්ෂාවන් හඳුනා ගත් අප "සමාජීය වශයෙන් කොන් වී සිටින, පරාජිත මානසිකත්වයෙන් මුළු ගැන්වී සිටින දරු දැරියන් විභාගයෙන් අසමත් වූවාට ඔබ ජීවිතයෙන් අසමත් වී නොමැත" යන්න පසක් කරමින් සමාජය ලෙස සුභවාදී ඇසකින් දකින්නටත් ඔවුන් තුල සැඟවී ඇති සමත්කම් මතු කරමින් ජීවිතය ජය ගැනීමට අවශ්‍ය ධෛර්ය ලබා දීම වෙනුවෙන් නේවාසික වැඩමුළුව ක්‍රියාත්මක කරන ලදී. එහි දී ඔවුන්ගේ සමත්කම් මතු කරමින්, පෞරුෂය වර්ධනය කිරීම සඳහා ක්‍රමික, ප්‍රායෝගික, විධිමත් වැඩ පිළිවෙලක් අප විසින් ක්‍රියාත්මක කරන ලදී.

වැඩසටහන නිම වී නැවත නිවෙස් කරා යන දරුවන්ගේ දෑස් තුලින් අප දුටුවේ ඔවුන් පරාජිතයන් නොව තව දුරටත් ජීවිතය ජය ගත හැකි මාර්ග පවතින බවයි. තවද ඔවුන්ගේ දෙමාපියන්, එම දරුවන්ගේ වෙනස පිළිබඳ කෘතඥ  පූර්වකව අගය කළෙමු. ව්‍යාපෘතියේ සාර්ථකවය තීරණය කිරීමේ දී සංඛ්‍යාත්මක දත්ත මෙන්ම එහි ගුණාත්මක තත්වයද එකසේ වැදගත් වේ.

නේවාසික කඳවුරු අවසානයේ දරු දැරියන් අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීමට හැකි මානසිකත්වයක් ඔවුන් තුල නිර්මාණය කිරීමට අප ව්‍යාපෘතිය ලද ජයග්‍රහනයකි.

(ඇ)"<u>විරැකියාවෙන් සුරැකියාවට</u>" ව්‍යාපෘතිය

අප අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි 2012 - දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල විසිරී සිටින තරුණ තරුණියන්ට වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමටත්, පෞද්ගලික අංශයේ රැකියා වෙත යොමු වීම සම්බන්ධයෙන් පවතින ආකල්පයන් වෙනස් කිරීමත්, සපුරා ඇති සුදුසුකම් මත පෞද්ගලික අංශයේ රැකියා වෙත යොමු කිරීමත් අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

2011 ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව ඉතා කඩිනමින් ආරම්භ කිරීමට උපදෙස් ලබා දෙන ලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක පවතින ප්‍රබල ගැටලුවක් ලෙස ආයතනයේ සේවක හිගය, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටපෙන්වා දීමෙන් අනතුරුව ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරයකුගේ හා නිලධාරීන් කීපදෙනෙකුගේ සහයෝගය ලබා ගන්නා ලෙස උපදෙස් ලැබුණි.

(I) එකඟ නොවෙමි.

උක්ත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට උපදෙස් ලැබෙන විටත් සෑම සති අන්තයකම ක්‍රියාත්මක වන ජංගම සේවා වැසටහන ආරම්භ වී තිබූ අතර, ඉතා කඩිනමින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය වූ නමුත් ව්‍යාපෘතියට අදාල කොන්දේසි සඳහන් ලංසු උපදේශකවරුන් මගින් කැඳවීමට පියවර ගත්හ.

ඒ අතුරින් අපගේ කොන්දේසි වලට එකඟතාවය පල කල උපදේශකවරයා සමඟ සාකච්ජා කොට ඔහුගේ සුදුසුකම් හා අනෙකුත් නිලධාරීන්ගේ සුදුසුකම් පරීක්ෂා කොට විධිමත් ගිවිසුමක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු භාරදුන් අතර, ආයතනික නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

උපදේශකවරයා සමඟ ගිවිසගත් ආකාරයට ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් පසුවද අපගේ අනෙක් ව්‍යාපෘති සඳහා ද උපදේශකවරයාගේ සහයෝගය ලබා ගන්නා ලද්දේ ඔහුගේ සේවය මැනවින් ඉටු කළ බව ස්ථානභාර නිලධාරීවරයා විශ්වාස කරන බැවිනි. දැයට කිරුළ ජාතික ප්‍රදර්ශන භූමියේ අප ආයතනයට අයත් ප්‍රදර්ශන කුටියේ අන්තර්ජාල සජීවී මැදිරියේ සිට ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සමඟ සිදු කළ සජීවී සාකච්ජාවේ දී මෙම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කළ බවට එතුමා කළ ප්‍රකාශයෙන් ද මෙය පසක් වේ. එහි සියළු දර්ශන අප සතුව පවතින අතර විගණන නිලධාරීන් හට අප ඒ බව ප්‍රකාශ කර ඇත.

(II) එකඟ වෙමි.

උක්ත ව්‍යාපෘතියේ දී ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශ වල ක්‍රියාත්මක වන ජංගම සේවා වැඩසටහන් සඳහා පැමිණෙන පිරිසෙන් අපගේ සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණි අතලොස්සක් පිරිසට ඔවුන්ට කිසියම් වෘත්තීය පුහුණුවක් තිබේද? යන කරුණ අප සොයා බලන අතර එසේ නොමැති පුද්ගලයින් අප අමාත්‍යාංශයේම වෘත්තීය පුහුණු ආයතන වලට යොමු කරන ලදී.

රැකියාවක් සොයා පැමිණෙන බොහෝ තරුණ තරුණියන් රජයේ රැකියාවක් අපේක්ෂාවෙන්ම පැමිණෙන අතර පෞද්ගලික අංශයේ රැකියාවකට හෝ යොමු වීමේ වැදගත්කම අප පෙන්වා දෙන නමුදු ඔවුන් තවදුරටත් සිටිනුයේ එම ආකල්පයේමය. එම නිසා පෞද්ගලික රැකියාවක් කිරීමට කැමති පිරිස පමණක් අප ලියාපදිංචි කර ගන්නා ලදී.

තරුණ තරුණියන් රැකියා ගත කිරීමේ වැඩපිළිවෙල ඉදිරියට රැගෙන යමින් ''ජාතික රැකියා ගැලපුම් මධ්‍යස්ථානය'' නමින් ජාතික රැකියා දත්ත බැංකුවක් 2012.02.05 වන දින ඔයාමඩුව දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දී අති ගරු ජනාධිපතිතුමාගේ සුරතින් ජනතා අයිතියට පත්කරන ලදී. දැයට කිරුළ ජංගම සේවය තුලදී ලියාපදිංචි කර ගත් සියළුම රැකියා අපේක්ෂකයන් ඔවුන්ගේ වර්ණ ඡායාරූපයක් ද සහිතව අප වෙබ් අඩවියට ඇතුලත් කර එහි ලියාපදිංචි පෞද්ගලික ආයතන වෙත රැකියා අපේක්ෂකයින්ගේ සුදුසුකම් පරීක්ෂා කර රැකියා සඳහා බඳවා ගැනීමේ අවස්ථාව අප උදා කරන ලදී. nhrdc.net ජාතික දත්ත පද්ධතිය හරහා රැකියා අපේක්ෂකයින්ට හා සේවා යෝජකයින්ට නොමිලේ, නිදහසේ ගනු දෙනු කිරීමේ අවස්ථාව අප සලසා දී ඇති බැවින් සේවයට බඳවා ගන්නන්ගේ සංඛ්‍යාව හා විස්තර සමහර රැකියා යෝජිතයින් විසින් අපට ලබා දී නොමැත.

උක්ත වෙබ් අඩවිය දෛනිකව යාවත්කාලීන වන බැවින් එහි ලියාපදිංචි වන පෞද්ගලික ආයතන සංඛ්‍යාව නිතර වෙනස් වේ. විගණිත දිනය වන විට ලියාපදිංචි වී තිබූ පෞද්ගලික ආයතන පිළිබඳ විස්තර විගණන නිලධාරීන්ට ලබා දුන් අතර nhrdc.net යටතේ මෙම තොරතුරු දැනුදු නිරීක්ෂණය කළ හැක.

(III) එකඟ නොවෙමි.

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව ක්‍රියාත්මක කළ ''අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන සතිය'' යටතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සති අන්තයේ ක්‍රියාත්මක කළ ජංගම සේවා වැඩසටහනෙහි සම්පූර්ණ සංවිධාන කටයුතු ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු කරන ලදී. එම ජංගම සේවා වෙත ජනතාව කැඳවා ගැනීමේ සම්පූර්ණ වගකීම පැවරෙන්නේ එහි සංවිධායක මණ්ඩලයටයි. ආයතන 50කට ආසන්න සංඛ්‍යාවක් මඟින් ජනතාවට විවිධ ජංගම සේවාවන් සැපයීමේ දී ප්‍රාදේශීය වශයෙන් එම ජනතාවට වඩාත් සමීප ගැටළු සඳහා විසඳුම් ලබා දීමට ඔවුන් පෙළඹීම ප්‍රායෝගික තත්වයයි. එහිදී ජලය, විදුලිය ලබා ගැනීම, මංමාවත් ඉදිකර ගැනීම, ස්ථිර නිවාස ගැටළුව, ඉඩම් ඔප්පු ලබා ගැනීම හා ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම, ඇස් කණ්නාඩි හා ඖෂධ ලබා ගැනීම වැනි ඔවුන්ට ඉතාමත් සංවේදී ගැටළු විසඳා ගැනීමට ප්‍රමුඛතාවය ලබා ගෙන ඇත. සංවිධායක කමිටුව මගින් අප ආයතනයේ ජංගම සේවා පැවැත්වීමට ලබා දෙන්නා වූ ස්ථානය හා පහසුකම් ආදියද මීට තදින් බලපායි.

උක්ත (II) දක්වා ඇති ආකාරයට අපගේ සේවාවන් වෙත යොමු වන පිරිසෙන් වෘත්තීය සුදුසුකම් නොමැති පිරිස නේවාසික පුහුණුවට යොමු කළ අතර, පෞද්ගලික අංශයේ රැකියාවකට යොමු වීමට කැමති පිරිස

පමණක් ලියාපදිංචි කර ගැනීම සිදු කර ඇත. නමුත් බහුතරයක් පැමිණෙනුයේ රජයේ රැකියා අවස්ථාවක් ලබා ගැනීම අරමුණු කරගෙනය. අප ඔවුන් වෙත පෞද්ගලික අංශයට යොමුවීමේ වැදගත්කම පිළිබඳ උපදේශන සේවාවක් ලබා දෙන ලදී.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ද අරමුණ වූයේ පෞද්ගලික අංශයේ රැකියාවක් වෙත යොමුවීමේ වැදගත්කම ජනතාව දැනුවත් කිරීමය. ඊට අදාල අපගේ පුවත්පත් දැන්වීම් වලින් පවා විවාදාත්මක ලෙස නිර්මාණශීලීව අප එය ඉටු කර ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කය පිළිබඳව ජන හා සංඛ්‍යාලේඛන සංඛ්‍යා දත්ත නිරීක්ෂණයේ දී පවා රැකියා වියුක්ත පිරිස සාපේක්ෂව ඉතා අඩු බව පෙනී යයි. තවද මෙම දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් තමන්ගේ ඉඩ කඩම් දේපල අතහැර දුර බැහැර ප්‍රදේශයක සේවයේ යෙදීමට අකමැති බව ඔවුන් සමඟ සාකච්ඡා කිරීමේ දී පෙනීගිය වැදගත් කරුණකි.

උක්ත ව්‍යාපෘතියේ ජංගම සේවා වැඩසටහන පිළිබඳ ඡායාරූප හා වීඩියෝ දර්ශන මඟින් අප විසින් සිදු කළ සේවය පිළිබඳ සාක්ෂි සනිටුහන් කළ හැක. එහි සමහර කොටස් අප විසින් විගණන නිලධාරීන්ටද ලබා දී ඇත.

ඉහත ආකාරයේ ප්‍රායෝගික තත්වයන්ද සැලකිල්ලට ගෙන ව්‍යාපෘතියක සාර්ථක අසාර්ථකභාවය විග්‍රහ කරන්නේ නම් අපි අගය කරමු.

(ඇ) <u>විශේෂ සමීක්ෂණ හා මිණුම්</u>

විෂයභාර අමාත්‍යවරයා විසින් කාලීනව නියම කරන විශේෂ සමීක්ෂණ හා පරීක්ෂණ සිදු කිරීමට අප සභාවේ පනත මඟින් බලය පැවරී ඇත. එමගින් අවශ්‍යතාවය අනුව ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ 04ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.

(I) එකඟ නොවෙමි.

මානව සම්පත් සංවර්ධනය යන පුලුල් විෂය ක්ෂේත්‍රය තුල කාලීනව සිදු විය යුතු සංවර්ධනයන් පිළිබඳ පර්යේෂණ සිදුකොට එම වාර්තා අප සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමක් ඉන් අනුමත වූ පසු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබේ. ඉන් ඉදිරියට තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

අප විසින් මෙහිදී ද සිදු කර ඇත්තේ අදාල ව්‍යාපෘති ගැටළු පිළිබඳ අධ්‍යයනය කර යෝජනාවලියක් ඉදිරිපත් කිරීම පමණි.

(II) එකඟ නොවෙමි.

"සාමාන්‍ය පෙළ අසමත් සිසුන්ගේ ඉදිරි අපහසුතා හඳුනා ගැනීම සඳහා සිදු කර තිබූ පර්යේෂණ" යනුවෙන් මෙහි සඳහන් කර තිබීමෙන් (ආ) VI පරිදි ඉලක්ක ගත නියදිය හා ඔවුන්ගේ අපේක්ෂාවන් පිළිබඳ පූර්ව අධ්‍යනයකින් තොරව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බවට විගණන වාර්තාවේ සඳහන් කර තිබීම සාවද්‍ය ප්‍රකාශයක් බව පෙනී යයි.

සා/පෙළ අසමත් සිසුන් වෙනුවෙන් එම ව්‍යාපෘති අප විසින් ප්‍රථම වරට සිදු කළ බැවින් ඒ පිළිබඳව පවතින ද්විතීක හා ප්‍රාථමික මූලාශ්‍ර ආශ්‍රයෙන් සමීක්ෂණයක් සිදු කොට මෙම ගැළුවේ ස්වභාවය හඳුනා ගැනීමට මූලික පර්යේෂණයක් සිදු කළ අතර ඒ තුලින් මෙම සමාජ ගැටළුවේ ස්වභාවය, එහි බරපතල බව හඳුනා ගන්නා ලදී. මේ පිළිබඳව විවිධ ක්ෂේත්‍ර නියෝජනය කළ විද්වතුන්, බුද්ධිමතුන්, විශ්ව විද්‍යාල මහාචාර්ය, ආචාර්යවරුන් සමඟ සාකච්ඡා කර විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමට පියවර ගත්තද, ඔවුන් තුලින් නිශ්චිත වැඩපිළිවෙලක් යෝජනා නොවීය. අප සභාවේ සිටින ඉතාමත් සීමිත සේවක සංඛ්‍යාවේ උත්සාහය

මත අපගේ දැනුමට ගෝචර කිසියම් වූ සහතිකයක් මෙම දරු දැරියන් වෙනුවෙන් ලබා දීමට පියවර ගන්නා ලදී. එතුලින් දිස්ත්‍රික් මට්ටමින් සිසුන් හා දෙමාපියන් දැනුවත් කොට සම්මන්ත්‍රණ හා නේවාසික වැඩමුළු පවත්වා ඔවුන්ට අවශ්‍ය පුහුණු අවස්ථා සඳහා NAITA ආයතනයට යොමු කරන ලදී. මේ පිළිබඳ (ආ) කොටසේ විස්තරාත්මකව දක්වා ඇත.

(ඉ) <u>මානව සම්පත් වසර</u>

එකඟ නොවෙමි.

මානව සම්පත් වසර වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන එක් ව්‍යාපෘතියක් වන "ජාතික නිපුණතා සඳ" ව්‍යාපෘතිය "තරු යුගය අවසන් - සඳ පෙරට ඇවිදින්" නිපුණතා යෞවනයේ රියැලිටි අධිෂ්ඨානය යන තේමාව යටතේ ආරම්භ කරන ලදී. සමස්ථ වෘතිතීය පුහුණු ක්ෂේත්‍රයම ඔසවා තැබීමත්, සාම්ප්‍රදායික වෘත්තීයන්ට නිසි ගෞරවය ලබා දීමත්, වෘත්තීය පුහුණු පාඨමාලා කෙරෙහි සිසුන්ගේ අවධානය දිනා ගැනීමත් අරමුණු කර ගනිමින් ආකර්ෂණීය ලෙස මෙගා රියලිටි වැඩසටහන ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශය කිරීමට නියමිතය.

වැඩසටහන පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ඔවුන්ගේ ප්‍රචාරණයන්, මතයන් වැඩසටහන ආරම්භ කිරීමට ප්‍රථම අවබෝධ කර ගැනීමට වෙනත් තේමාවක් ඔස්සේ මාධ්‍ය මගින් ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී. එහි දී ඉදිරිපත් වූ යෝජනා වැඩසටහනේ සංවර්ධනයට උපයෝගී කර ගත්හ.

මේ වන විට, සිරස TV, සිරස FM ආයතන ප්‍රධානීන් සමඟ උක්ත ව්‍යාපෘතිය ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා වට ගණනාවක් පවත්වා ඊට අදාල ඇස්තමේන්තු සකස් කිරීම හා වැඩසටහනට අදාල පූර්ව ප්‍රචාරණ පටය නිර්මාණ කටයුතු සිදු කර ඇත.

(ඊ) <u>මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන</u>

එකඟ නොවෙමි.

2011 වර්ෂය තුල මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ වෙනම වියදමක් දරා තිබුණේ එක් වැඩසටහනක් වෙනුවෙන් වූ බැවින් විගණනය අවබෝධ කරගෙන තිබූයේ මහජනයා දැනුවත් කර තිබුණේ එක් වැඩසටහනක් ලෙසය. නමුත් අප විසින් ක්‍රියාත්මක කරන ලද සා/පෙළ හා උ/පෙළ අසමත් සිසුන් සඳහා වූ ව්‍යාපෘති වලදී අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පමණක් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් මෙන්ම දිස්ත්‍රික් වැඩසටහන් තුලදී ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 20 කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇත. ඒ පිළිබඳ තොරතුරු එම ව්‍යාපෘති වලට අදාල ලිපි ගොනු මගින් සනාථ කළ හැක.

(උ) එකඟ වෙමි. මෙය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන සිදු කර ඇත.

(ඌ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.

(I) එකඟ වෙමි.

නියමු සමීක්ෂණය සිදු කරන ලද්දේ උක්ත දත්ත බැංකුව පිහිටුවීම පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීම සඳහාය. ඉන් නිරීක්ෂණය වූයේ අප සභාව සතු භෞතික, මානව හා මූල්‍යමය සම්පත් මෙවැනි දීප ව්‍යාප්ත සුවිශාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවන බවයි. එබැවින් මෙම වැඩසටහන 2010 වර්ෂයේදී නවතා දමන ලද අතර එය 2010 විගණන වාර්තාවේ සඳහන් කොට ඇත.

(II) එකඟ වෙමි.

මීට අදාල අවසාන තීරණයක් ගැනීමේ අවස්ථාව අප සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇත.

(III) එකඟ නොවෙමි.

මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පවතින අතර මීට අදාල විගණන පිළිතුරු ඉහත පිළිතුරු මඟින් ද සඳහන් කර ඇත.

(එ) 2011 වර්ෂයේද වෙනස් වැඩසටහන් ප්‍රථමයෙන් ආරම්භ කළ බැවින් ජනතාව අතරට ආකර්ෂණීය ආකාරයෙන් නව මුහුණුවරකින් රැගෙන යාම සඳහා මාධ්‍ය ප්‍රචාරණය ඊට යොදා ගන්නා ලදී. වර්තමාන සමාජය තුල ඕනෑම වැඩසටහනක සාර්ථක අසාර්ථකත්වය කෙරෙහි ජනමාධ්‍ය විශාල බලපෑමක් ඇති කරයි. ලාභය මත පදනම්ව කටයුතු කරන ජනමාධ්‍ය ආයතන ජාතික වැදගත්කමකින් යුතු සමාජයට මෙහෙවරක් සිදු කරන වැඩසටහන් සඳහා වුව ද නොමිලේ ප්‍රචාරයක් ලබා දීමට ඉදිරිපත් නොවේ. උදාහරණයක් ලෙස පුවත්පතක ව්‍යාපෘතියක් පිළිබඳව ලිපියක් පලවීමට නම් එම පුවත්පතට වෙළඳ දැන්වීමක් ලබා දිය යුතු මට්ටමට අද මාධ්‍ය පත් වී ඇත.

## 05 - කොටස

### ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1. සංයුක්ත සැලැස්ම

(අ) එකඟ වෙමි.

මෙම වරද 2013 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(ආ) එකඟ වෙමි.

මෙම වරද 2013 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

5.2. ක්‍රියාකාරී සැලැස්ම

(අ) එකඟ නොවෙමි.

එම වැඩසටහන් 8 ක්‍රියාත්මක කිරීමට වෙන් කර තිබූ අරමුදල් ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාත්මක කළ වැඩසටහන් අවසන් කිරීමට යොදවා ගන්නා ලදී. ඒ අනුව අනුමත කළ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

(ආ) එකඟ වෙමි.

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම මානව සම්පත් වසර නැමැති වැඩසටහන ඇතුලත්ව ඇත.

(ඇ) එකඟ නොවෙමි.

එක් ප්‍රධාන වැඩසටහනක් යටතේ පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් ප්‍රමාණය වැඩසටහන ක්‍රියාත්මක කරන අතරවාරයේදී වෙනස්වූ අතර, සමහර වැඩසටහන් එක් දිස්ත්‍රික්කයක මාධ්‍ය දෙකකින් පැවැත්වීමටද හේතුවීමටද සිදුවිය. මේ හේතුවෙන් දීප ව්‍යාප්තව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරවාරයේ ඔවුන්ගේ අවශ්‍යතා හා ආකල්ප හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්වල ස්වභාවයද වෙනස් විය. මේ හේතුවෙන් වැඩසටහනට වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති තත්වයක් තුල සැලසුම් නොකල වියදම දරන්නට සිදුවී තිබුනි.

5.3. අභ්‍යන්තර විගණනය

එකඟ වෙමි.

දැනට රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු සිදු කරයි.

5.4. <u>අය වැය ලේඛනමය පාලනය</u>

එකඟ වෙමි.

මෙයට හේතුවී ඇත්තේ අයවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමයි. . (ඇමුණුම 02)

**<u>06 - කොටස</u>**

**<u>පද්ධති හා පාලන</u>**

එකඟ වෙමි.